

# EDUCATION




I believe that an education is one of the most valuable things that a human can receive. A proper education can allow someone to discover their strengths and weaknesses and then use what they have gained to benefit themselves as well as everyone else. Through what we learn we can pave a pathway for our future, and if we are not satisfied with our living conditions we can make a better life for ourselves. In a country like Australia there are so many ways for us to get a good education, there are countless opportunities for students. However, in other countries children may not have access to a proper school or education system and therefore they may yearn what we take for granted.

South Sudan was ranked as the country with the lowest literacy rate. In 2013 it was estimated that the country's population was 11.3 million with a literacy rate of 27%. On the other hand, a developed country such as Australia has a literacy rate of 99%. This shows how lucky we are in Australia, where nearly everyone has access to an education. Yet, statistics like this should also open our eyes to the conditions of those living in countries which are still developing, where a proper school may cost too much and therefore many children may not be able to afford schooling. To create a world where every human being has equal opportunities and are not discriminated based on their gender, where they are born or what socio-economic status they were born into, we must first lay down the foundations by making sure that every child has the opportunity to go to a school and learn to read and write. The UN has strived to achieve universal primary education which would mean that literacy rates all around the world would increase and therefore more people would gain the basic communication skills to complete higher education and get a job. This would lead to an end in the poverty cycle because as more people get a job and earn an income they will be able to improve their living conditions and create a more comfortable life for themselves.

We know firsthand how valuable the skills we learned at school are, and therefore we should also open our hearts and help provide the same education to others who have not been able to learn what we had. Whether we give donations or spread awareness we should work to bring literacy rates around the world to as close as possible to 100%. We are a global community and therefore we should look out for each other and make sure that everyone is able to gain a proper start to their life. As people that are able to easily attend school and learn about any subject that we wish, we should be grateful and not waste this opportunity. Going to school should not be seen as a chore, but instead should be seen as a vital stepping stone to achieving our dream job and living the life that we always wanted. We should use every resource that we have available to us and make the most of what we have.

When we learn something, we grow a little bit more, we become a bit more wiser and we are able to understand a bit more of what is happening around us. Education provides the platform for future development and in order to see global growth and the elimination of poverty, everyone must be able to access basic education regardless of where they reside. Progression is slowly being made and I believe that in the future every child will have the ability to go to school and learn.

"Education is the most powerful weapon which you can use to change the world."- Nelson Mandela

---

**45 පිටෙන්**

ඒ සඳහාම වෙන්වුණු හිතේ නිදහසකින් ආශාවකන් කරනවා විය නොහැක. ඇඳුමේ මැහුම් අතරින් ඈට මැවෙන්නේ තාත්තෙකු නැති ඒ දරු පැටියාගේ මුහුණයි. මේ පැටලුම ලෙහෙසියෙන් හැරිය නොහැක. ඈ කුඩා ඇඳුම් පොඩිය පසෙකින් තබා යළිත් නූල් බෝලයේ පැටලුම් හරින්න වෙහෙසෙයි. මෝරා වැඩෙන කුස දෙස බලමින් ඈ නූල් බෝලය අතට ගෙන ලිහන්නට බැරි පැටලුමක අන්දමන්ද වෙයි. පැටලුණු නූල් බෝලය ඇගේ මේ ජීවිතයම සංකේතාර්ථයෙන් අපට පෙන්වන අතර ඇඳුම් පොඩියේ තටු නොනිමි කුරුලු පැටියන් තාත්තෙකු අහිමි එනම් රැකවරණයක් නැති උපදින්න නියමිත තවත් පැටියෙකුගේ අසම්පූර්ණ ජීවිතය සංකේතවත් කරනයුරු ඉතාමත් අපූරුවට ගැළපේ. එන්න එන්නම ආරමින් කුස වැඩී ආවද ඒ ජීවිත නූල් බෝලයේ පැටලුම් ලිහී කුරුලු පැටවුන්ගේ පියාපත් සැපිරේ යැයි සිතීමත් ඈට නම් සිහිනයක්ම බඳු දෙයක්ය. නමුත් මේ දේවල් දෙමාපියන්ගේ කීම නොඅසා ඈ හිතු මනාපයේ සිදුවූ දෙයක් විය හැකි යැයි අපට සිතෙන්නේ මේ සෑම රූප රාමුවකම ඇගේ ගොළු නිහඬතාවයම මනාව ඉස්මතුවී, ඒ වෙනුවෙන් කාටවත් වරද පටවන්නට ඇගේ දිව නොනැමෙන අයුරු පැදිලිවම දැක ගත හැකි බැවිනි.

කැමරාව තව දුරටත් ඈ වෙතම නාභිගත වේ. ඇගෙන් මිදී හෙට උපදින්න නියමිත දරු පැටියාගේ ජීවිතයම චිත්‍රණය කරන ඇඳුම් පොඩිය වෙත එය තවත් ළං වේ. අපට දැන් දැන් ඈ මසන දෙය වඩාත් පැහැදිලිව දැකගත හැක. බාහිර පරිසරයේ කළුවම, එනම් ඇගේ ජීවිතයට උදාවූ මේ කළුවරම නිරූපණය කරන කාල වර්ණ අහසක් ඒ මැස්මෙනුත් නිරූපිතය. එය ඉබේටම ඈ අතින් එලෙස වර්ණ ගැන්වී මැසෙන්නට ඇත. ජීවිතය තැලී තැලී පොඩි වෙවී තියෙනකොට ජීවිතයම ඇසුරුකරගෙන නිමැවෙන නිර්මාණයකත් ඒ අන්ධකාර වර්ණයන්ම ලැගුම්ගන්නා හැටි මනාව ඉන් විද්‍යමාන වේ. ඒ දුර්වර්ණ අහස මැද වලාකුළු එක පෙළට පාව යයි. කළු පාට අහසක් අතහැර ඈතට පාව යන සුදෝ සුදු වලාකුළු මොනවා චිත්‍රණය කරනවා වියහැකිද? එදා ඉඳන් ඈත් එක්ක සමීපව සිටි හිත මිතුරු නෑදෑ සනුහර මින් ගම්‍යමාන වනවා විය නොහැකිද? තම හතර වරිගයේම දැලි ගෑවායි කියමින් අවලාද නඟමින් වහ වහා ඈත් වෙන නෑදෑයන් මෙන්ම, කරදරයක් වූ අවස්ථාවක වඩාත්ම ළඟින් සිටිනවා වෙනුවට ඉන් පළා යන ව්‍යාජ මිතුරු සනුහරයන්ද ඉන් පිළිබිඹු වේ යැයි මට හිතේ. මෙවන් වූ කළුවන් අහසක පුංචි කුරුල්ලන් තටු ලැබී කොහොම ඉගිලෙන්නද? තම දරු පැටියා පා නඟන්නට හදන විෂම වූ වෛරී ලෝකය ඇගේ අවිඥානය විසින් මැස්ම ඇතුළේ නිරූපණය වීම අතිශය උත්ප්‍රාසාත්මක වූ ඛේදාන්තයක් බඳුය. එවන් වූ කර්ණ කටුක පසුබිමක තටු නොලද කුරුලු පැටවුන්ගේ හෙට දවස මොන වගේ වේද? ඈ සතු එකම දුක හා පැණය එයයි; පිළිතුරු රහිත පිළිතුරු බලාපොරොත්තු විය නොහැකි ඇගේම ශෝකී කතා පුවතයි.

නඳුන් යසිත සූක්ෂම කැමරා ශිල්පියෙකු සේ කැමරාව හසුරවමින් තම සහෝදරියගේ ජීවිතය ගැන සමීප කියැවීමකට අපට ඉඩ හරී. එය කවියාගේ පෞද්ගලිකත්වයෙන් මිදී සමස්ථ සහෝදරියන් හෝ ගැහැනියන් වෙනුවෙනුත් විවෘත කියැවීමකට මග පාදන නිමැවුමකි. එය ඔහු ගොඩ නඟන්නේ ස්වකීය අත්දැකීම හා පරිකල්පනය ඔස්සේ වන අතර, ඉතාමත් විශ්වාසනීයව ඔහු ඒ ගොඩ නැංවීම සිදු කරයි. ඔහු අපට පෙන්වන රූප රාමු පෙළ අතර ඔහුව කොතනකවත් රූපයක් සේ දැක ගන්න නොලැබුණද අප කථකයා යනු කෙබඳු සියුම් තැනැත්තෙක් දැයි කියා පාන්නට ඒ සෑම රූප රාමුවක්ම ඉවහල් වේ. භාෂාව සැරසිල්ලක් කොට නොගෙන පරිස්සමින් තෝරාගත් ඉතා සියුම් වචන ඔස්සේ ඔහු අපේ ජීවිත තුළද ඥානනය දල්වන්නට සමත්වන්නේ ඉතා පරිණත කවියකු පරිද්දෙනි. වචනවලින් දමා නොගසා, වචනවලින් සද්ද නොකර සමස්ථ කවියෙන්ම දමා ගසන්නට නඳුන්ට හැකිවන්නේ ඒ නිසාය. ඉතින් මේ පුංචි කවිය යනු, ඔහු කැමරාව හිතෙන හිතෙන පැත්තට අල්ලා අතරින් පතර එල්ලූ අහඹු රූප සමූහයක් නොව, ඉතාමත් සවිඥානකව දැනුවත්ව පෙන්වන ලද, අපේම වූ කතාවක් අපට කියවා ගන්නට මාර්ගය තනා දුන් සැකිලි රූ සමූහයක් බව දැන් ඔබට වැටහී යා යුතුය.

